*සැ. යු.*– 2006.11.03 වැනි දින අංක 1,470 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොකරන ලදී.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ වෛද්‍යවෘත්තිකයන්ගේ, දන්ත වෛද්‍යවරුන්ගේ සහ ශල්‍ය වෛද්‍යවරුන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,471- 2006 නොවැම්බර් 10 වැනි සිකුරාදා - 2006.11.10**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 944 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... .. | 946 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 948 |
| නාවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.*–(i) බ්‍රිතාන්‍ය අධ්‍යාපන නියෝජිතයින්ගේ සංගමය ශ්‍රී ලංකාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 ඔක්තෝබර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත 2006 ඔක්තෝබර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 නොවැම්බර් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 නොවැම්බර් මස 03 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 327

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2311.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

### නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් ජොෂ්ඨ නිලධාරි 2006 අප්‍රේල් මස 07 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/50868 කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්)ක්‍රිෂාන්ත රොෂාන් මයිකල් සිල්වා, ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී.

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් ජොෂ්ඨ නිලධාරියා 2006 අප්‍රේල් මස 08 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමතකර ඇත.

නි/50868 බ්‍රිගේඩියර් ක්‍රිෂාන්ත රොෂාන් මයිකල් සිල්වා ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

11-202

---

2006 අංක 328

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2164.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් ජොෂ්ඨ නිලධාරියා 2006 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් කපිල සේනාධි රත්නායක ආර්ඩබ්පී, ආර්එස්පී ගරෙ (0/50996)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී, පීඑස්සී.
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

11-203

---

2006 අංක 329

## ජාතික ශිෂ්‍යභට බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2006 මාර්තු මස 31 දින සිට තාවකාලික මේජර් වශයෙන්*

කපිතන් ජේඒ්යූජේපී ජයසූරිය
කපිතන් ඩබ්එම්සීකේකේ වනසිංහ
කපිතන් ජීකේපී රවීන්ද්‍රකුමාර
කපිතන් එන්සීජී සිල්වා
කපිතන් එම්ජ්ආර්එස්කේ මල්ලවාරච්චි
කපිතන් එම්සී තිලකානන්ද
කපිතන් බීපීඑන්පී සිල්වා
කපිතන් එච්යූඑස් ගොඩගේ
කපිතන් ජේඑම් දිසානායක

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

11-204

---

2006 අංක 330

## ජාතික ශිෂ්‍යභට බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

(අ) *1999.11.11 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) එච්පීසීඩබ්කේජේ පතිරණ
ලුතිනන් (තාවකාලික කපිතන්) එස්එම් උපාලි බණ්ඩාර
ලුතිනන් (තාවකාලික කපිතන්) ජීඑන් සමරසිංහ

(ආ) *2000.08.25 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්එම්එන් සෝමසිරි

(ඇ) *2001.05.15 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) කේජීපීඩබ්කේ ඇඹව

(ඈ) *2001.08.25 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්එම්එස් සෙනෙවි ශාන්ත

(ඉ) *2002.05.10 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) එම් විජේසේකර
ලුතිනන් (තාවකාලික කපිතන්) කේසී ජගත් කුමාර

(ඊ) *2002.05.11 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) ඩී නයිදුවාවඩු
ලුතිනන් (තාවකාලික කපිතන්) ඒකේ උභයවංශ
ලුතිනන් (තාවකාලික කපිතන්) ජීආර්ජී චන්ද්‍රසේන
ලුතිනන් (තාවකාලික කපිතන්) ආර්එම්ටීකේ රාජපක්ෂ
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්එම්ජීකේජීකේ වීරකෝන්
ලුතිනන් (තාවකාලික කපිතන්) බීජීඑස් සමන්ති (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) එස්අයිපී සොයිසා (ගැ)

(උ) *2002.08.19 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) ඊඑම්යූකේ ඒකනායක
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ් ඒ ලාල් ද සිල්වා

(ඌ) *2002.08.21 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) එස් අබේසිරිවර්ධන
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්ඒඩීජේඩබ්පී වැලිකල

(එ) *2003.08.25 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) යූඩීබී අලහකෝන්

(ඒ) *2003.08.29 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) ආර්එම්සී රත්නායක
ලුතිනන් (තාවකාලික කපිතන්) කේඩී ද සිල්වා
ලුතිනන් (තාවකාලික කපිතන්) එස්ඒබී සමරසිංහ
ලුතිනන් (තාවකාලික කපිතන්) එන්පීකේ අත්තනායක
ලුතිනන් (තාවකාලික කපිතන්) සීඒ හෙට්ටිආරච්චි
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්එම්පීජීපීකේ පලිපාන
ලුතිනන් (තාවකාලික කපිතන්) ජීයූකේ එදිරිසූරිය
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්ජීආර් කරුණාතිලක
ලුතිනන් (තාවකාලික කපිතන්) බීඒපීකේ ජයසිංහ
ලුතිනන් (තාවකාලික කපිතන්) ඒ සෝමරත්න
ලුතිනන් (තාවකාලික කපිතන්) ජේඑම්එම්ඒ ජයලත්
ලුතිනන් (තාවකාලික කපිතන්) එස්ඩී දිසානායක
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්ඒකේ වීරසූරිය
ලුතිනන් (තාවකාලික කපිතන්) ඊඑච්ආර් නන්දසේන
ලුතිනන් (තාවකාලික කපිතන්) ජීඑස්ඩබ් පීරිස්
ලුතිනන් (තාවකාලික කපිතන්) එච්ඒඑම්ඒ බණ්ඩාර
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩීඑම් සුගතපාල
ලුතිනන් (තාවකාලික කපිතන්) බීජීඩී දේශප්‍රිය
ලුතිනන් (තාවකාලික කපිතන්) එල්යූඩබ් ජයලත්
ලුතිනන් (තාවකාලික කපිතන්) සීඑන්සී සිල්වා
ලුතිනන් (තාවකාලික කපිතන්) අයිඑන්එන්බී රත්නායක
ලුතිනන් (තාවකාලික කපිතන්) එම්ඒ වසන්ත කුමාර
ලුතිනන් (තාවකාලික කපිතන්) එම්එම් රෝහණ
ලුතිනන් (තාවකාලික කපිතන්) ටීඑම්එම්ඒ තෙන්නකෝන්
ලුතිනන් (තාවකාලික කපිතන්) යූඅයි දිඹුල්කුඹුර
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්ඒඑන්එම් වීරසිංහ

(ඔ) *2004.05.15 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) ඒයූ කුරුප්පු (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්ඩබ්එම්ටීඑෆ්ඩී වීරසූරිය

(ඕ) *2004.09.01 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) ඩීඑම්එන් කරුණාතිලක
ලුතිනන් (තාවකාලික කපිතන්) එම්ඩබ්ඩීඑම්පීකේ බණ්ඩාර (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) යූඑම්යූ කිත්සිරි
ලුතිනන් (තාවකාලික කපිතන්) කේඑස් පෙරේරා (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) ආර්කේ ආරියවංශ
ලුතිනන් (තාවකාලික කපිතන්) ජේසී බුමුණුසිංහආරච්චි

(ක) *2005.07.20 දින සිට කපිතන් වශයෙන්*

ලුතිනන් (තාවකාලික කපිතන්) එච්කේඒ දයාකාන්ති (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) ජේඒආර් වීරතිලක
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩීඑම්එල්කේ දිසානායක
ලුතිනන් (තාවකාලික කපිතන්) ආර්එම්කේබී ඇඹව
ලුතිනන් (තාවකාලික කපිතන්) එම්එච්එම් රවුෆ්
ලුතිනන් (තාවකාලික කපිතන්) ජේඒසී පෙරේරා (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) එල්වී මලලගම
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්ඒ ජයතිලක
ලුතිනන් (තාවකාලික කපිතන්) ආර්පීසී රාජපක්ෂ
ලුතිනන් (තාවකාලික කපිතන්) පීඑල්එම්ආර් විජේවර්ණසූරිය
ලුතිනන් (තාවකාලික කපිතන්) ආර්පීඑල් ධර්මසිරි
ලුතිනන් (තාවකාලික කපිතන්) එච්පී මෙවන්තිස්ස
ලුතිනන් (තාවකාලික කපිතන්) ජීසීටී ගුණවර්ධන (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) ඒඩබ්ඒ ශ්‍රියන්ත
ලුතිනන් (තාවකාලික කපිතන්) යූසී පෙරේරා (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩීඑම්එම්ජී දිසානායක
ලුතිනන් (තාවකාලික කපිතන්) පීඒ ශාන්ත
ලුතිනන් (තාවකාලික කපිතන්) එන්එන් නානායක්කාර (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩබ්ජීසී විජේගුණවර්ධන (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) ජේකේ රොබට්සන්
ලුතිනන් (තාවකාලික කපිතන්) කේඑම්ආර් කෝනාර
ලුතිනන් (තාවකාලික කපිතන්) එච්බීපීඑම් මෙන්ඩිස් (ගැ)
ලුතිනන් (තාවකාලික කපිතන්) ඩීඑම්පීජී කිරිබණ්ඩා
ලුතිනන් (තාවකාලික කපිතන්) ජීජීඑස්ආර් බණ්ඩාර
ලුතිනන් (තාවකාලික කපිතන්) ජීඩබ්ජීඑච් නිලන්ත

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2006 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

11-189

# ආණ්ඩුවේ නිවේදන

## සමිති ආඥාපනත

(123 අධිකාරය) සමිති ආඥාපනතේ 3 සහ 4 වගන්ති වලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු සහ අලෙවි සංවර්ධන, මහා මාර්ග ඇමති ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ වන මම මේ නිවේදනයෙන්,

(1) කොළඹ 06, වැල්ලවත්ත, පෙරේරා පාර, අංක 51 දරන ස්ථානයේ පිහිටි "රසික හෝම් රෙසිඩන්ෂල් එපාර්ට්මන්ට් ඕනර්ස් සොසයිටි ලිමිටඩ්" නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතේ බලතල හා පහසුකම් ව්‍යාප්ත කලයුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි.

ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ,<br>වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු<br>සහ අලෙවි සංවර්ධන, මහා මාර්ග ඇමති<br>සහ පාර්ලිමේන්තු ආණ්ඩුපක්ෂ ප්‍රධාන සංවිධායක.

2006 ඔක්තෝබර් මස 17 වැනි දින,<br>වෙළෙඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු සහ අලෙවි සංවර්ධන අමාත්‍යාංශය,<br>අංක 21, වෝක්ෂෝල් වීදිය,<br>කොළඹ 02.

11-222

---

## උද්භිද හා සත්ත්ව උද්‍යාන ප්‍රවර්ධන අමාත්‍යාංශය

### ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පිහිටුවීම

2006 මාර්තු 22 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය අනුව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් පහත දක්වා ඇත.

1. ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමේ ලා පරිබාහිර සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.

2. අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව හා ශාක සම්පත් හා බැඳී පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබාදීමට වැඩ සටහන් ක්‍රියාවට නැංවීම.

3. ශ්‍රී ලංකාවේ මල් වගා ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත්හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.

4. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වාගෙන යාම.

5. සුදුසු ස්ථානවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩ සටහන් සැලසුම් කිරීම.

6. අලංකරණ උද්‍යාන විද්‍යාව (Amenity Horticulture) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණ වැඩ සටහන් ක්‍රියාවට නැංවීම

7. ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමින් යුතු වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබාදීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව 2006.08.23 දින රාජ්‍ය කළමනාකාර සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලයට අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු යටතේ පේරාදෙනියේ පවත්වාගෙන යනු ඇත.

බන්දුල බස්නායක පා. ම.,<br>උද්භිද හා සත්ත්ව උද්‍යාන ප්‍රවර්ධන අමාත්‍ය.

11-206

---

## පුරාවස්තු ආඥාපනත

### නියමය

1998 අංක 24 දරන පනතේ සංශෝධිත (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥා පනතේ 39 අ වගන්තියේ (1) වන උප වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා වන මා විසින් මේ නියමය මගින් මෙහි උපලේඛනයේ නියමිත දක්වා ඇති සාමාජිකයන් පුරාවිද්‍යා උපදේශක කමිටුවට පත් කරනු ලැබේ.

මහින්ද යාපා අබේවර්ධන,<br>සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2006 ජූලි මස 27 දින දී,<br>බත්තරමුල්ල,<br>සෙත්සිරිපාය,<br>8 වන මහල,<br>සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න මහතා,<br>"භාගරතී",<br>අංක 78, ඉහළ ගම්මැද්ද, කහල්ල, කටුගස්තොට.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජගත් වීරසිංහ මහතා,<br>පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය,<br>බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07.

පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ අධි සාමාජික,<br>සිරිනිමල් ලක්දුසිංහ මහතා,<br>අංක 639/2, බණ්ඩාරනායක මාවත,<br>වේයන්ගොඩ.

11-175

## උකස් පනත

89 වැනි අධිකාරය වූ උකස් පනතේ 3(ඇ) හා 114(2) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වාණිජ අධ්‍යක්ෂ ජනරාල් මානෙල් ද සිල්වා වන මම මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආයතන එම පනතේ කාර්යයන් සඳහා 2006.10.20 වැනි දින සිට වලංගු වන පරිදි අනුමත කළ ණය දෙන ආයතන බවට මෙම නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

මානෙල් ද සිල්වා,
වාණිජ අධ්‍යක්ෂ ජනරාල්.

2006 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ.

### උපලේඛනය

1. සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
2. සීමාසහිත අබාන්ස් ෆිනෑන්ෂල් සර්විසස්
3. සීමාසහිත මාතලේ සමූපකාර ග්‍රාමීය බැංකු සමිතිය

11-277/1

## දේශීය භාරකාර ආදායම් ආඥාපනත

1990 අංක 14 දරන දේශීය භාරකාර ආදායම් පනතේ 6 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වාණිජ අධ්‍යක්ෂ ජනරාල් මානෙල් ද සිල්වා වන මම මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආයතන එම පනතේ කාර්යයන් සඳහා 2006.10.20 වැනි දින සිට වලංගු වන පරිදි අනුමත කළ ණය දෙන ආයතන බවට මෙම නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

මානෙල් ද සිල්වා,
වාණිජ අධ්‍යක්ෂ ජනරාල්.

2006 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ.

### උපලේඛනය

1. සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
2. සීමාසහිත අබාන්ස් ෆිනෑන්ෂල් සර්විසස්
3. සීමාසහිත මාතලේ සමූපකාර ග්‍රාමීය බැංකු සමිතිය

11-277/2

---

## භාරකාර ආදායම් ආඥාපනත

1990 අංක 03 දරන පනතින් සංශෝධිත 1947 අංක 12 දරන භාරකාර ආදායම් ආඥාපනතේ 6 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වාණිජ අධ්‍යක්ෂ ජනරාල් මානෙල් ද සිල්වා වන මම මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආයතන එම ආඥාපනතේ කාර්යයන් සඳහා 2006.10.20 වැනි දින සිට වලංගු වන පරිදි අනුමත කළ ණය දෙන ආයතන බවට මෙම නිවේදනයෙන් ප්‍රකාර කරමි.

මානෙල් ද සිල්වා,
වාණිජ අධ්‍යක්ෂ ජනරාල්.

2006 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ.

### උපලේඛනය

1. සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
2. සීමාසහිත අබාන්ස් ෆිනෑන්ෂල් සර්විසස්
3. සීමාසහිත මාතලේ සමූපකාර ග්‍රාමීය බැංකු සමිතිය

11-277/3

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/41875/සීඩී6/718.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.02.20 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :—

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2001.05.03 දින හා අංක 6964 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මොරටුව පදිංචි හෙට්ටිආරච්චිගේ ගාමිණී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.22 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ දහදහස් හාරසිය තිස් අටයි ශත විසි පහ (රු. 2,10,438.25) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 6964 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අසූපහයි ශත හැට දෙක (රු. 85.62) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත, කටුවාවල, 3 වෙනි පටුමග, අංක 21/10 ඒ හි බලයලත් වෙන්දේසිකාර එෆ්. ආර්. ගල්හේන මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල මොරටුව මහ නගර සභා සීමාව තුළ කටුකුරුන්ද ග්‍රාමයේ පිහිටි සුහන්ද නිවාස පෙදෙසෙහි වරිපනම් අංක 15/3 හි දැන් කටුකුරුන්ද නිවාස යෝජනා ක්‍රමය නමින් හඳුන්වන මාදන්ගහවත්ත *නොහොත්*කොරමාදන්ගහවත්ත, කොට්ටම්බගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. වී. සම්පත් ප්‍රනාන්දු විසින් සකසන ලද 2001.10.13 දිනැති අංක 902 දරන මිණුම් පිඹුරේ දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 5.63 ක්වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඊට අයත් සියලු දේත් සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ඔක්තෝබර් මස 27 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-246/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 2/75074/ජී2/032.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.03.09 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :—

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පී. වීරත්න විසින් සහතික කරන ලද 2004.07.18 දින හා අංක 2315 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම තිත්තපත්තර පදිංචි දෙණවත්තේ ගෙදර විජේසූරිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැත්තෑ දෙදහස් පන්සිය විසිදෙකයි ශත විසිදෙක (රු. 2,72,522.22) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2315 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අසූ නවයයි ශත තිස් හය (රු. 89.36) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ, පාගොඩ පාර, අංක 3හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාව තුළ දොම්පේ අංක 03 උප කාර්යාල සීමාවට අයත් උමන්දල පිහිටි පෙලෙන්ගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 2003.07.29 වැනි සකසන ලද අංක 1992 දරන මිණුම් පිඹුරේ කැබලි අංක ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 14.7ක් වූ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමග වේ.

තවද, ඒ රත්නම් මානක තැනගේ 2001.06.01 දින සහ අංක 9009 දරන පිඹුරේ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කළ) කැබලි අංක ජී මගින් දක්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ඔක්තෝබර් මස 27 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-246/6

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/45417/සීඩී7/941.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2005.07.28 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :—

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඩබ්. පී. එෆ්. ඒකනායක විසින් සහතික කරන ලද 2003.05.01 දින හා අංක 426 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම මහරගම පදිංචි ඩිංගිරි බණ්ඩා තිලකරත්නගේ ගාමිණී තිලකසිරි හා අසෝකා ජයන්ති මල්ලිකාරච්චි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.05.01 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හයලක්ෂ හතලිස් තුන් දහස් අටසිය හතලිස් පහයි ශත හත (රු. 6,43,845.07) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 426 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය පනස් දෙකයි ශත හතලිහ (රු. 252.40) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම නගර සභා සීමාව තුළ ගොඩිගමුව පිහිටි වීදියබණ්ඩාර පෙදෙසේ වරිපනම් අංක 21/2 දරන බෝගහවත්ත සහ අළුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. පී. ජී. ඩී. ඩී. ජයවර්ධන විසින් සකසන ලද 2000.02.16 දිනැති හා අංක 2235 දරන පිඹුරේ කැබලි අංක 1ඩී1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 6ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද, ඩබ්. පී. ජී. ඩී. ඩී. ජයවර්ධන මිනින්දෝරු තැනගේ 1994.07.31 වැනි දින හා අංක 1427 දරන පිඹුරේ කැබලි අංක 1එෆ් (ප්‍රවේශ මාර්ගයක් සඳහා වෙන් කරන ලද බිම් තීරුව) මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ඔක්තෝබර් මස 27 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-246/1

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 24/0/00/00850.

ණයකරුගේ සම්පූර්ණ නම : අප්පුකුට්ටි ආරච්චිගේ නිලන්ති කුමාරි.

අවිස්සාවේල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. ඒ. ධර්මකීර්ති විසින් ලියා සහතික කරන ලද අංක 1559 හා 2001.07.03 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ විසිදහස් දෙසිය පනස් හයයි ශත පනස් අට (රු. 1,20,256.58) ක මුදලක් වර්ෂ 2003.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූතුන් දහස් හයසිය හතලිස් හතරයි ශත තිස්පහ (රු. 93,644.35) මුදල ද වර්ෂ 2003.03.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිහය දහස් හයසිය දොළහයි ශත විසිතුන (රු. 26,612.23) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ විසිදහස් දෙසිය පනස් හයයි ශත පනස් අට (රු. 1,20,256.58) ද,

(2) එකී රුපියල් අනූතුන්දහස් හයසිය හතලිස් හතරයි ශත තිස්පහ (රු. 93,644.35) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.90% බැගින් වන පොළියක් 2003.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, සීතාවකපුර නගර සභා සීමාවේ, අවිස්සාවේල්ල ග්‍රාමයෙහි 04 වැනි පටුමග, රත්නපුර පාරේ වරිපනම් අංක 50/16 හි පිහිටි හුසේනිවත්ත නමැති ඉඩමට 2000.05.09 දින ඒ. හෙට්ටිගේ මානක තැන විසින් මැන සම්පාදිත අංක 2809 පිඹුර ප්‍රකාර ලොට් 32ට මායිම්, උතුරට : ලොට් 29 ද, නැගෙනහිරට : ලොට් 33 ද, දකුණට : ලොට්36 ද, බටහිරට : ලොට් 54 (පාර) ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) වපසරියකින් යුතු මෙම

ඉඩම හා ඊට අයත් සියලුදේද, මාර්ග පරවශතාවය ද සමග අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී. 129/167 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2003 ක් වූ මැයි මස 30 වැනි දින කොළඹ දීය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

11-245

---

## රුහුණ සංවර්ධන බැංකුව-ඌරුබොක්ක ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශේෂ *ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2005.10.26 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සුමිත් එච්. පස්ගොඩගේ මහතා විසින් සහතික කරන ලද 2003.12.18 දිනැති අංක 1249 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "රොටුඹ, දෙන්කන්දලිය සපුගහකන්ද" හි පදිංචි ජාසිංහ දිසානායක ගාමිනී සහ ජාසිං දිසානායක පියදාස යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් එක්ලක්ෂ විසිනමදහස් හයසියහැටදෙකයි ශත පනහ (රු. 1,29,662.50) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2004.12.31 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් එක්ලක්ෂ විසිනමදහස් හයසියහැටදෙකයි (රු. 1,29,662) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 1249 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

01. දකුණු පළාතේ, මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මොරවක් කෝරළයේ, දෙන්කන්දලිය ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, රොටුඹ නමැති ගමේ පිහිටා ඇත්තාවූද, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් හාරයේ ඇති සහ සර්වේ ජනරාල් විසින් සම්පාදිත මාර/91/143 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක ජේ දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කර ඇත්තාවූද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි පහයි හයක් විශාලත්වය ඇත්තාවූද පහත දැක්වෙන පරිදි මායිම්වූද, මුගුණහේන නමැති රජයේ ඉඩම, උතුරට : මුගුණහේන රජයේ ඉඩම, නැගෙනහිරට : මුගුණහේන රජයේ ඉඩම, දකුණට : මුගුණහේන රජයේ ඉඩම, බස්නාහිරට : දොල රක්ෂිතය ද.

මෙම දේපළ වං/සා/6/127 A යටතේ 2003.12.19 දින මොරවක ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරී,

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන, මාතර

11-163/1

---

## රුහුණ සංවර්ධන බැංකුව-හක්මණ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශේෂ *ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2005.10.26 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඌරාපොල තරසිංහගේ චන්ද්‍රලතා මහත්මිය විසින් සහතික කරන ලද 2004.06.09 දිනැති අංක 1177 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පුහුල්වැල්ල, කිරින්ද, ආරන්‍යපාර, අංක 02, "ශාන්ති" හි පදිංචි ඇල්ගිරියහේවාගේ සිරිපාල සහ මද්දුමාරච්චිගේ කරුණාවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ විසිහයදහස් අටසියයක (රු. 3,26,800) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2004.11.11 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් තුන්ලක්ෂ විසිහයදහස් අටසියයක (රු. 3,26,800) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 1177 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, ගඟබඩපත්තුවේ, කිරින්දේ පිහිටි වඩුගේකැල්ල *හෙවත්* වඩුගෙකොරටුව කියන ඉඩමේ බෙදා වෙන්කළ අංක 08 දරන කැබැල්ලට මායිම්, උතුරට : පාරද, නැගෙනහිරට සහ දකුණු නැගෙනහිරට : ආඩියාකන්දවත්ත සහ දිවුගලහේනද, බස්නාහිරට : වතුර පාරක්ද, උතුරු බස්නාහිරට : එම ඉඩමේ අංක 09 දරන කැබැල්ලද යන මායිම් තුළ පිහිටි රූඩ් එකකුත් පර්චස් විසිහතකුත් දශම නවයයි අටක් (අ. 0, රූ. 1, පර්. 27.98) ක් විශාල ඉඩමේ සියළු ගහකොළ, පළතුරු සමග බිම සහ එහි තිබෙන ගොඩනැගිලිද වේ.

මෙම දේපළ C 462/221 යටතේ 2004.06.10 දින මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ජී. විමලරත්න,
සාමාන්‍යාධිකාරී.

2005 ඔක්තෝබර් මස 26 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

11-163/2

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරුන් අතරේ බෙදා හැරීමේ යෝජනා සම්මතයෙන් සම්මත කරගත් යෝජනාව

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006.06.15 වැනි දින ඒකමතිකව අනුමත කරන ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2002ක් වූ ජුලි මස 30 වැනි දිනැති අංක 2874 දරන උකස් බැඳුම්කරය මගින්, දෙදෙනාම බොරලැස්ගමුව, කටුවාවල, කැපිටල් සිටි, අංක 137/7 හි (අනෙක් ලිපිනය බොරලැස්ගමුව, කටුවාවල, කැපිටල් සිටි අංක 130/7) ජයසිරි අනුර විතානගේ සහ දෝන තේජා කුමුදිනී විතානගේ යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපල සහ පරිශ්‍රයන්, කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76හි පිහිටි (මෙහි මින්මතු ‘බැංකුව’ යනුවෙන් සඳහන් කෙරෙන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත උකස් කරන ලද හෙයින් ද,

තව ද, එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල ගෙවීමට එකී ජයසිරි අනුර විතානගේ සහ දෝන තේජා කුමුදිනී විතානගේ යන අයවලුන් පැහැර හරින ලදුව වර්ෂ 2006ක් වූ අප්‍රේල් මස 01 වැනි දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත එකී බැඳුම්කරය මත රුපියල් අටලක්ෂ හැට නවදහස් පන්සිය අසූ හතරකුත් ශත හැට නවයක (රු. 869,584.69) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන් දේපළ සහ පරිශ්‍රයන්, එකී රුපියල් අටලක්ෂ හැට නවදහස් පන්සිය අසූ හතරකුත් ශත හැට නවයක (රු. 869,584.69) මුදල ද, වර්ෂ 2006ක් වූ අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂ 2006ක් වූ අප්‍රේල් මස 01 වැනි දින වන විට කාල ණය මත හිඟව ඇති ප්‍රාග්ධනය වන රුපියල් අටලක්ෂ පනස්හය දහස් අටසිය හැට අටයි සත විසි දෙකක (රු. 856,868.22) මුදලක් මත එක් වර්ෂයකට 22.50%ක අනුප්‍රමාණය බැගින් තවදුරටත් පොළිය ද, ඒ සමඟ අනුගාමී ගාස්තු ද, ප්‍රචාරය කිරීමේ ගාස්තු ද, වැය කරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (කිසියම් මුදලක් වේ නම්) මුදල අඩු කළ පසු මුදල, අයකර ගැනීම සඳහා කොළඹ වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක හි ත්‍රිවංක සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

කොටුගොඩ, කුරුඳුවත්ත, ඒකල පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද වර්ෂ 2001ක්වූ ජනවාරි මස 22 වැනි දිනැති අංක 1819 දරන පිඹුරේ ලොට් කේ 10 වශයෙන් සලකුණු කොට දැක්වෙන එහි ඕටීඑස් ඉඩමෙහි (OTS IDAMA) එහි පිහිටි ගහකොල පලතුරු සහ සියලුම දේ සමඟ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, එකී ලොට් කේ 10 දරන කැබැල්ලට මායිම්, උතුරට : මෙහි ආර් 74 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද වර්ෂ 2000ක් වූ නොවැම්බර් මස 15 වැනි දිනැති අංක 1816 දරන පිඹුරේ ලොට් ජේ ද, දකුණට : මෙහි ලොට් ආර් 75 ද සහ බස්නාහිරට : මෙහි ලොට් කේ 9 ද, වන ප්‍රමාණයෙන් පර්චස් හයක් සහ දශම නමයයි හයක් (අ. 0, රූ. 0, පර්. 6.96) හෝ එකී අංක 1819 දරන පිඹුර ප්‍රකාරව වර්ග මීටර් 176,000ක් වන ඉඩම් කොටස.

මෙහි පහත දැක්වෙන මාර්ග රක්ෂිතය ඔස්සේ හෝ ඒ මතින් බර පැටවූ හෝ නොපැටවූ වාහන ඇතිව හෝ නැතිව යාමට ඒමට සහ පසුකර යාමටත් මෙහි එකී ගැනුම්කරුගේ හා ඔහුගේ පූර්වෝක්තයන්ගේ පාවිච්චිය සහ ප්‍රයෝජනය පිණිස එකී මාර්ගය ඔස්සේ හෝ ඒ මතින් ප්‍රධාන ජලාපවහන සහ ජල සම්පාදන නළ, විදුලි රැහැන් හා උඩින් කම්බි සහ වෙනත් උපකරණ යෙදීමට සහ ඉදිකිරීමටත් ඉහත විස්තර කර ඇති පරිශ්‍රය භුක්ති විඳීමට සම්බන්ධ සියලුම කාරණාවන් සඳහා පූර්ණ නිදහස අයිතිය සහ මුක්තිය සහ අවසරය ප්‍රදානය කෙරෙන නමුත් එම අයිතිය භුක්ති විඳීමේ දී එවැනි අයිතීන්ට හිමිකම් ඇති සෙස්සන්ගේ අයිතිවාසිකම්වලට බාධාවක් කවර ආකාරයකින් හෝ අන්දමකින් සිදු නොවිය යුතු ය.

1. බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද වර්ෂ 2000ක් වූ නොවැම්බර් මස 15 වැනි දිනැති අංක 1816 දරන පිඹුර ප්‍රකාරව එහි දැක්වෙන ලොට් ආර් 2 සහ ආර් 3.

2. බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද වර්ෂ 2001ක් වූ ජනවාරි මස 22 වැනි දිනැති අංක 1819 දරන පිඹුර ප්‍රකාරව එහි දැක්වෙන ලොට් ආර් 74 සහ ආර්. 75 (සේවා ප්‍රදේශය)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

76, යෝර්ක් වීදිය,
කොළඹ 1.

11-200

---

## සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත සඳහන් යෝජනා සම්මතය, ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව,

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් ලියා සහතික කරන ලද අංක 12228 හා 2004.12.17 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "කේ. එම්. එස්. ට්‍රේඩර්ස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස අලව්වේ ව්‍යාපාරය කරගෙන යන, අලව්වේ, කපුගම මානික්කගේ සෝමරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2006 මැයි 31 වැනි දිනට ඉහත කී අංක 12228 දරන උකස් බැඳුම්කරය මත එකී කපුගම මානික්කගේ සෝමරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් පහළොස් ලක්ෂ අසූඑක් දහස් එකසිය හතලිස් හතරකුත් ශත හැත්තෑ තුනක (රු. 15,81,144.73) මුදලක් සහ 2006 ජූනි මස 01 වැනි දින සිට වර්ෂයකට සියයට විසිනවය (රු. 29%) බැගින් ගණන් බලන ලද පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් පහළොස් ලක්ෂ අසූඑක් දහස් එකසිය හතලිස් හතරකුත් ශත හැත්තෑ තුනක (රු. 1581,144.73) මුදල 2006 ජූනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂයට සියයට විසිනවය (29%) බැගින් වූ පොළිය ද මීට අදාළ ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියට අනුකූලව ඉහත කී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 12228 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර තිබෙන මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි, කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 12228 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, දකුණු උඩුකහ කෝරළේ, අලව්වේ පිහිටි ඇත්දෙමටගහමුල හේන නැමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු කේ. ඒ. අමරතුංග විසින් මැන සාදන ලද අංක 683 හා 1999.07.13 දින දරන පිඹුරේ දැක්වෙන (එම මිනින්දෝරුවරයා විසින් ම 2003.09.12 වැනි දින කරන ලද අතුරු බෙදීමක් වන) ලොට් 4බී ලෙස පෙන්නුම් කර තිබෙන බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම් වන උතුරට : එම පිඹුරේ ලොට් අංක 4ඒ දරන බිම් කට්ටිය, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් අංක 4ඒ දරන බිම් කට්ටිය, දකුණට : රංජිත් මාපාට අයිති ඉඩම, බස්නාහිරට : සකුන්තලා මාපාට අයිති ඉඩම යන මායිම් ඇතුළත පර්චස් දශම හයක් (අ. 0, රූ, 0, පර්. 6) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ ඊට අනුබද්ධ වෙනත් සියලු දේ.

එල්. ජී. පෙරේරා,
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 03.

11-228

### ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත සඳහන් යෝජනා සම්මතය, ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ගුණවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 2280 හා 2001 සැප්තැම්බර් මස 25 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "ප්‍රියන්ත සත්ව ගොවිපළ" යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන හල්මිල්ලෑවේ, ජයසිංහ මුදියන්සෙලාගේ ප්‍රියන්ත චන්ද්‍රකුමාර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2006 ජූලි මස 30 වැනි දිනට ඉහත කී අංක 2280 දරන උකස් බැඳුම්කරය මත එකී ජයසිංහ මුදියන්සෙලාගේ ප්‍රියන්ත චන්ද්‍රකුමාර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හත්ලක්ෂ පන්දහස් හයසිය තිස් හතරකුත් ශත හැත්තෑ දෙකක (රු. 7,05,634.72) මුදලක් සහ 2006 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ හතලිස් හතර දහස් අටසිය අසූහතරකුත් ශත පනස් තුනක් (රු. 4,44,884.53) සඳහා වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් ගණන බලන ලද පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හත්ලක්ෂ පන්දහස් හයසිය තිස් හතරකුත් ශත හැත්තෑ දෙකක (රු. 7,05,634.72) මුදල සහ 2006 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ හතලිස් හතර දහස් අටසිය අසූ හතරකුත් ශත පනස් තුනක් (රු. 4,44,884.53) සඳහා වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් ගණන් බලන ලද පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී අංක 2280 දරන උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව, ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2280 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ, බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ, ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### *අංක 2280 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, කිනිගම කෝරළේ, කුඩාකොළව පිහිටි, "දික්හේන" නැමති ඉඩමේ, බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් මැන සාදන ලද අංක 1560 හා 2001.07.08 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 04 දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන

උතුරට : එකී පිඹුරේ ලොට් අංක 3 ලෙස ලකුණු කළ ඉඩම ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් අංක 6 ලෙස ලකුණු කළ ඉඩම ද, දකුණට : හබෝවැව සිට පහළ හන්තිගවට යන ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : උපාලි සෙනරත් බණ්ඩාර සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද, යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් එකකුත් පර්චස් විසි එකයි දශම හතරක් (අ. 1, රූ. 1, පර්. 21.4) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 03.

11-230

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත සඳහන් යෝජනා සම්මතය, ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් ලියා සහතික කරන ලද අංක 10853 සහ 10854 හා 2003 ජූනි මස 18 වැනි දින දරන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම "රත්ගහ උළු කර්මාන්ත ශාලාව" යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන දංකොටුවේ, ඇරැච්චලගේ දොන් ඩිනුක්ස් ඉනන්ද යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2006 ජූනි මස 30 වැනි දිනට ඉහත කී අංක 10853 හා 10854 දරන උකස් බැඳුම්කරය මත එකී ඇරැච්චලගේ දොන් ඩිනුක්ස් ඉනන්ද යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් විසිඑක් ලක්ෂ අසූපන්දහස් හයසිය හතකුත් සහ දොළහක (රු. 21,85,607.12) මුදලක් සහ 2006 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහසය ලක්ෂ තුන්දහස් තුන්සිය දහයකුත් ශත පණස් හතරක් (රු. 16,03,310.54) සඳහා වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් ගණන් බලන ලද පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් විසිඑක් ලක්ෂ අසූපන්දහස් හයසිය හතකුත් සහ දොළහක (රු. 21,85,607.12) මුදල සහ 2006 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් දහසය ලක්ෂ තුන්දහස් තුන්සිය දහයකුත් ශත පණස් හතරක් (රු. 16,03,310.54) මුදලක් සඳහා වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් ගණන් බලන ලද පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව, ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා ඉහත කී අංක 10853 හා 10854 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ, බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ, ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 10853 හා 10854 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, පිටිගල් කෝරළේ, ලිහිරියාගම පිහිටි අඹගහවත්ත, දිවුල්ගහවත්ත, බුත්වලේවත්ත, ලොට් ඩී උණගහකුඹුර ලොට් ජී සහ අඹගහවත්ත කොටසක් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. ඒ. එච්. ගුණතිලක විසින් මැන සාදන ලද අංක 865 හා 2003.03.07 දින දරන පිඹුරේ ලොට් අංක 02 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන උතුරට : ඉන්නනන්ද හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : පාවුල් පෙරේරා හිමිකම් කියන ඉඩම ද, දකුණට : ඉහත සඳහන් පිඹුරේ ලොට් අංක 01 සහ එම්. එම්. විල්බට් හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : සුන්දරපොළ, සින්ගක්කුලිය පාර සහ ලොට් අංක 1 යන මායිම් ඇතුළත රූඩ් දෙකකුත් පර්චස් තිස්පහකුත් දශම පහක් (අ. 0, රූ. 2, පර්. 35.5) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 03.

11-229/2

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය, ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තැව විසින් ලියා සහතික කරන ලද අංක 1926 හා 2003 අගෝස්තු 12 දින දරන

උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "කේ. එම්. එස්. ට්‍රේඩර්ස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස අලව්වේ ව්‍යාපාරය කරගෙන යන අලව්වේ, කපුගම මානික්කගේ සෝමරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2006 මැයි 31 වැනි දිනට ඉහත කී අංක 1926 දරන උකස් බැඳුම්කරය මත එකී කපුගම මානික්කගේ සෝමරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2006 මැයි 31 වැනි දිනට ඉහත කී අංක 1926 දරන උකස් බැඳුම්කරය මත එකී කපුගම මානික්කගේ සෝමරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එකොලොස් ලක්ෂ තිස්එක් දහස් තුන්සිය දෙකකුත් ශත අසූපහක (රු.1,131,302.85) මුදලක් සහ 2006 ජුනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ තුන්දහස් හයසිය හැත්තෑවක් (රු. 903,670) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 01, අප්‍රියෙල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවල දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා/මාසික පදනමක් මත පළ කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකයක් මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එකොළොස් ලක්ෂ තිස් එක් දහස් තුන්සිය දෙකකුත් ශත අසූපහක (රු 1,131,302.85) මුදල සහ 2006 ජුනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ තුන්දහස් හයසිය හැත්තෑවක් (රු. 903,670) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 01, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවල දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා/මාසික පදනමක් මත පළ කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකයක් මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑfප්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1926 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ, බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### *අංක 1926 හා 2003.08.12 දින දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, දකුණු දඹදෙනි උඩුකහ කෝරළේ අලව්වේ පිහිටි ඇත්දෙමටගහමුල හේන දැනට වත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඒ. අමරතුංග විසින් මැන සාදන ලද අංක 2001 හා 2002.11.21 දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් අංක 5 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන :-උතුරට : එකී පිඹුරේ ලොට් අංක 4 දරන බිම් කට්ටි ය ද, නැගෙනහිරට : එම්. එම්. අබේසේනට අයිති ඉඩමද, දකුණට : ගාමිනී රංජිත් මාපාට අයිති ඉඩමද, බස්නාහිරට : අලව්වේ සිට නාරම්මලට යන මහ පාර ද යන මායිම් ඇතුළත පර්චස් දෙකයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 2.4) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි වරිපනම් අංක 66 දරන කඩකාමරය හා ඊට අනුබද්ධ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

11-229/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.